# පිරිවෙනේ පරිහානිය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හෙවත් එවකට ලංකා විශ්වවිද්‍යාලය නමින් හඳුන්වනු ලැබූ විශ්වවිද්‍යාලයෙහි ශාස්ත්‍ර පීඨයට පෙරදිග අධ්‍යයන පීඨයට වැඩි වැදගත්කමක් ලැබුණේ සිංහල, පාලි, බෞද්ධ සංස්කෘතිය වැනි විෂයයනට ලැබුණු අඩු සැලකිල්ල සංකේතවත් කරමිනි. එපමණක් නො වේ. පෙරදිග අධ්‍යයන පීඨයෙහි වුව ද භික්ෂූන් වහන්සේට නායකත්වයක් නැතිවිය. ඒ පීඨයෙහි ද දශක හතරකට පමණ පෙර අධ්‍යයන මාධ්‍යය ඉංගිරිසි විය. භික්ෂූන් වහන්සේ පිරිවෙනේ අධ්‍යාපනය ලැබුයේ සිංහල මාධ්‍යයෙනි. එබැවින් පෙරදිග අධ්‍යයන පීඨයෙහි වුව ද ශිෂ්‍යයන් අතර ද ආචාර්යවරුන් අතර ද භික්ෂූන් වහන්සේ එතරම් දක්නට නො ලැබුණි.

මෙය ලංකා විශ්වවිද්‍යාලය ආරම්භවීමට පෙර ද තිබූ තත්වයකි. ලංඩන් විශ්වවිද්‍යාලයේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ආයතනය (University College) ඇරඹූ දිනවල සිට ම මේ තත්වය දකින්නට තිබුණි. සාමාන්‍යයෙන් පිරිවෙන්වල හදාරනු ලැබූ විෂය විශ්වවිද්‍යාල ආයතනයේ ඉංගිරිසි මාධ්‍යයෙන් උගන්වනු ලැබිණි. එහි ආචාර්යවරු ලංඩන් විශ්වවිද්‍යාලය ඇතුළු එංගලන්තයේ විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි ලබාගත්තෝ වූහ. මොවුහු බොහෝ විට ගිහියෝ වූහ. ඔවුන්ට පුහුණු කෙරුණේ බටහිර දෘෂ්ටි කෝණයෙන් හැදෑරීමට ය. ඒ පුහුණුව පිරිවෙන් සම්ප්‍රදායෙන් බැහැර විය.

ලංකා විශ්වවිද්‍යාලයත් ඉන්පසුව පේරාදෙණි විශ්වවිද්‍යාලයත් බටහිර සම්ප්‍රදායෙහි ම අධ්‍යාපනයක් සාමාන්‍යයෙන් පිරිවෙන් අධ්‍යාපනයේ ඉගැන්වුණු විෂය සම්බන්ධයෙන් දීමේ ප්‍රතිඵලය ලෙස ඒ විෂය සම්බන්ධයෙන් පවා භික්ෂූන් වහන්සේගේ නායකත්වය ක්‍රමයෙන් නැතිවිණි. මෑතක් වන තුරුම බොහෝ දෙනාගේ මතය වූයේ ඒ විෂය සම්බන්ධයෙන් පිරිවෙනේ ප්‍රාචීන පණ්ඩිත පරීක්ෂණයේ මට්ටම විශ්වවිද්‍යාල උපාධියේ මට්ටමට වඩා උසස් බව ය. එසේ වුවත් 1956 වන තුරුම ප්‍රාචීන පණ්ඩිත පරික්ෂණය සමත් වූ ගුටැවරයකුට ලැබුණු වැටුප එකල ජ්‍යෙෂ්ඨය (අධ්‍යයන පොදු සහතික සාමාන්‍ය පෙළ) සමත් ගුරුවරයකු ලැබූ වැටුපට සමාන විය. ප්‍රාචීන පණ්ඩිත පරීක්ෂණය සමත් අයගේ වැටුප උපාධිධාරී ගුරුවරයකුගේ වැටුපට සමාන කර ඇත්තේ පනස්හයෙන් පසුව ය.

එහෙත් එහි වූයේ වැටුපෙන් ඔබ්බට ගිය ප්‍රශ්නයකි. වැටුප් සමාන කිරීමෙන් සිදුවූයේ ප්‍රාචීන පණ්ඩිත පරීක්ෂණය උපාධි මට්ටමට ඇති බව පිළිගැනීම ය. එහි වැදගත් කරුණ නම් මිනුම් දණ්ඩ උපාධිය වීම ය. පිරිවෙන පරීක්ෂාවට ලක්වූයේ විශ්වවිද්‍යාලයේ මිනුම් දඬු යොදා ගනිමිනි. සිංහල පාලි වැනි විෂය සම්බන්ධයෙන් ද පරීක්ෂණවල මට්ටම් කෙසේ වුවත් විශ්වවිද්‍යාලයට වැඩි පිළිගැනීමක් විය. එංගලන්තයේ හෝ වෙනත් බටහිර රටක හෝ පශ්චාත් උපාධි ලැබූ ගිහි පඬිවරුන්ට ක්‍රමයෙන් වැඩි පිළිගැනීමක් ලැබෙන්නට විය.

එක් පැත්තකින් සාම්ප්‍රදායික පිරිවෙන් අධ්‍යාපනයට අදාළ විෂයයනට විශ්වවිද්‍යාලයෙහි අනෙක් විෂය හා සමග සැසඳීමේ දී අඩු වටිනාකමක් ලැබෙත්දී අනෙක් පැත්තෙන් ඒ අදාළ විෂය සම්බන්ධයෙන් පවා පිරිවෙනට විශ්වවිද්‍යාලයට අඩු පිළිගැනීමක් ලැබිණි. දහනවවැනි සියවසෙහි අග භාගයේ දී සිංහල බෞද්ධ පුනර්ජීවනයේ කොටසක් ලෙස ඇරඹි පිරිවෙන විශ්වවිද්‍යාල ආයතනය ඇරඹීමෙන් පසුව ක්‍රමයෙන් ඊනියා තත්වයෙන් පිරිහිණි. පනස්හයේ පෙරළියෙන් පසු පරිහාණිය තවත් වැඩිවූයේ සිදුවෙමින් පවතින්නේ කුමක් ද යන්න පිළිබඳ අවබෝධයක් සමස්තයක් ලෙස ගත්කල භික්ෂූන් වහන්සේ ඇතුළු බොහෝ දෙනකුට නොමැතිවීම හේතුවෙනි.

පනස්හයේ සිදු වූ බොහෝ දෑ අනවබෝධයේ ප්‍රතිඵල වෙයි. පනස්හත පමණ වන විට විද්‍යාලංකාර පිරිවෙන විශ්වවිද්‍යාල තත්වයට උසස්කිරීම සඳහා ඉල්ලීමක් විය. සිංහල බෞද්ධයන් ඉන් බලාපොරොත්තු වූයේ පිරිවෙනට සමාජ පිළිගැනීමක් ලබාගැනීමට ය. එහෙත් මෙහි දී සිංහල බෞද්ධයන් අමතක කළ කරුණක් විය. පිළිගැනීම යනු වාස්තවික වුවක් නොවන බව ඔවුහු අමතක කළහ. ඕනෑම පිළිගැනීමක් ලැබෙන්නේ යම් සමාජ ක්‍රමයක ය. එනම් පිළිගැනීම සමාජයට, සමාජ ක්‍රමයට සාපේක්ෂ ය.

© Prof. Nalin De Silva

පනස්හයේ පෙරළියෙන් සමාජය හෝ සමාජ ක්‍රමය හෝ වෙනස් නොවිණි. සමාජ ක්‍රමය දිගින් දිගට ම බටහිර ක්‍රිස්තියානියට නැඹුරුවෙමින් පැවතිණි. අද පවත්නා විශ්වවිද්‍යාල බටහිර යුරෝපීය වැඩවසම් යුගයේ ඇතිවූ ආයතන මිස මහාවිහාරයේ හා අභයගිරියේ අනුප්‍රාප්තික පිරිවෙන් නො වී ය. පිරිවෙනට විශ්වවිද්‍යාල තත්වය දීම යනු පිරිවෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට හසුකර ගැනීමක් විය. එහෙත් ඒ බව භික්‍ෂූන් වහන්සේට අවබෝධ විණි යැයි කිවහැකි නො වේ. උන්වහන්සේ ද ගිහි බෞද්ධයන් ද නොදැනුවත්ව ඉල්ලා සිටියේ පිරිවෙන බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට නතුකරගන්නා ලෙස ය.

නිදහස් අධ්‍යාපනය, පාසල් රජයට පවරා ගැනීම ආදියෙහි දී මෙන් ම පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත්කිරීමේ දී ද සිංහල බෞද්ධයන්ට තමන් ඉල්ලන්නේ කුමක් ද යන්න තේරුම්ගත නො හැකි විය. ඔවුන් ඒ සියළු අවස්ථාවන්හි ඉල්ලා ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ප්‍රචලිතකිරීම සඳහා පසුබිම සකස් කරන ලෙස ය. ක්‍රිස්තියානි හා කතෝලික පූජකවරුන් හා වෙනත් අය එහි දී විරුද්ධ වී ඇත්තේ ද කරුණු හරිහැටි තේරුම්ගත නොහැකිවීමෙන් ය.

විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත්වීමෙන් පසුව සිදු වී ඇත්තේ කුමක් දැයි විමසා බැලීමෙන් සිංහල බෞද්ධයන්ට වැරදී ඇති ආකාරය තවදුරටත් අවබෝධ කරගත හැකි ය. අද ඒ විශ්වවිද්‍යාල අදාළ නම්වලින්වත් හඳුන්වනු නො ලැබෙයි. ඒ විශ්වවිද්‍යාලවල පැරණි සම්ප්‍රදාය හා උරුමය රැකගැනීමට, එනම් ඒ සම්ප්‍රදායෙහි තවදුරටත් වර්ධනයක් දැකීමට, අවශ්‍යවූවෝ කිහිපදෙනෙක් වෙති. එහෙත් ඔවුන්ට ඒ සඳහා ඇත්තේ ඉතාමත් සීමිත ඉඩක් පමණකි.

පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත්වීමෙන් පසුව ඒ වර්ධනය වූයේ මුළුමනින් ම ලංකා විශ්වවිද්‍යාලය අනුකරණය කරමින් ය. පිරිවෙන්වල එවකටත් ඉගැන්වූ භික්‍ෂූන් වහන්සේ විශ්වවිද්‍යාල බවට පත්වීමෙන් පසුව තවදුරටත් ආචාර්යවරුන් මහාචාර්යවරුන් ලෙස සේවය කළ බව සැබෑ ය. පළමු උපකුලපතීන් වහන්සේලා ද භික්‍ෂූන් වහන්සේ ම විය. එසේ වුවත් උන්වහන්සේ ගත යුත්තේ කිනම් මගක් ද යන්න නිශ්චිතව නොදැන සිටියහ. එයට ප්‍රධාන හේතුව වූයේ පිරිවෙන් අධ්‍යාපනය ඒ වන විට බටහිරින් ලබාගත යුත්තේ කුමක් ද ඒ ලබාගන්නේ කෙසේ ද ආදී ප්‍රශ්න ගැන විමසීමක් නොකර තිබීම ය.

කලින් සඳහන්කර ඇති අන්දමට දහනවවැනි සියවසේ පිහිටුවනු ලැබූ පිරිවෙන දැනුම නිර්මාණය කරන ආයතනයක් නො වී ය. ථෙරවාදය ආරක්‍ෂාකිරීම අපේ වගකීම ලෙස සැලකූ අවධියේ සිට දැනුම නිර්මාණය පිරිවෙනින් ඉවත් විය. අනෙක් අතට බටහිරින් පැමිණි දැනුම අවශෝෂණය කරන්නේ කෙසේ ද යන්න ද අප සිතාබලා නො තිබුණි. එහි එක් ප්‍රතිඵලයක් වූයේ බටහිරින් ලැබෙන දැනුම හුදු අනුකාරකයන් අතට පමණක් පත්වීම ය.

පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත් වූ මුල් අවධියෙහි එහි ඉගැන්වූයේ බොහෝ විට පිරිවෙනේ ඉගැන්වූ දෑම ය. එහෙත් වැඩිකල් නොගොස් ම මානව ශාස්ත්‍ර හා ශාස්ත්‍ර පීඨවල විෂය නිර්දේශ පේරාදෙණියේ ලංකා විශ්වවිද්‍යාලයේ නිර්දේශ අනුව සකස් කෙරිණි. ඉන්පසු ක්‍රමයෙන් අනෙක් පීඨ ද පිහිටුවනු ලැබිණි. ඒ පීඨ තනිකරම පේරාණේයේ හා කොළඹ ආකෘති පමණක් බවට පත්විය. බටහිර දැනුම ගෙඩිය පිටින් ගනු හැරෙනු කොට ඒ පීඨවල ආරම්භකයන් දැනසිටි අන් දෙයක් නො වී ය. පිරිවෙන් දැනුම නිර්මාණය කරන ආයතන නොවූ බැවින් එහි ඉගැන්වූ දැනුම යල්පැනගිය එකක් සේ සලකා බැහැරකිරීම ගැටළුවක් නො වී ය.

එහෙත් විශ්වවිද්‍යාලවල කෙරුණු දැනුම් නිර්මාණයක් ද නො වී ය. එසේ වුවත් විශ්වවිද්‍යාලවල උගන්වනු ලැබුයේ බටහිර දැනුම ය. ඒ දැනුම බටහිර නිරන්තරයෙන් නිර්මාණය වූ බැවින් එය යල් පැන නොගිය දැනුමක් යැයි කීමට කිසිවකුට හැකිවිය. අනෙක් අතට දැනුම් ආධිපත්‍යය බටහිරයන් සතුවිය. එබැවින් විශ්වවිද්‍යාල බවට පත්වූ පිරිවෙන් වැඩි කලක් යෑමට පෙර ම බටහිර විශ්වවිද්‍යාලවල අනුකාරක ආයතන බවට පත්විය. පිරිවෙන්වල උගන්වා විශ්වවිද්‍යාල තත්වය ලැබීමෙන් පසුව එහි ආචාර්ය මහාචාර්ය පදවිවලට පත්වූ භික්‍ෂූන් වහන්සේ විශ්‍රාම යෑමෙන් පසුව විශ්වවිද්‍යාලවල පිරිවෙන් ලකුණ තව තවත් මැකී යන්නට විය.

© Prof. Nalin De Silva

අනෙක් අතට ඉතිරි වූ පිරිවෙන්වලට සිදුවූයේ කුමක් ද යන්න ද අප විමසා බැලිය යුතු ය. පිරිවෙන්වල ඉගැන්වූ දක්‍ෂ උගත් භික්‍ෂූන් වහන්සේ විශ්වවිද්‍යාලවල ආචාර්ය මහාචාර්යවරුන් ලෙස පත්වීම් ලැබීමෙන් පසුව පිරිවෙන්වල ඉතිරි වූ භික්‍ෂූන් වහන්සේට ලැබුණු සමාජ සැලකිල්ල අඩුවිය. එමෙන් ම ආයතනයක් ලෙස ගත්ත ද පිරිවෙනට තිබූ තත්වය ද නැතිවිය. පිරිවෙනට විශ්වවිද්‍යාල තත්වය ලැබීමෙන් කියැවුණේ විශ්වවිද්‍යාලය පිරිවෙනට වඩා උසස් බව ය. කිසිවකු ලංකා විශ්වවිද්‍යාලයට පිරිවෙන් තත්වය ලබාදීමට උත්සාහ කර නැත. ධුරාවලියේ විශ්වවිද්‍යාලය පිරිවෙනට ඉහළින් විය. එබැවින් පිරිවෙන විශ්වවිද්‍යාල තත්වයට පත්කිරීමෙන් පසුව පිරිවෙනේ ඉතිරි වූ කොටසට සමාජයේ එතරම් තත්වයක් නො ලැබිණි. ඉන් වූයේ පිරිවෙන හා පිරිවෙන් අධ්‍යාපනය සමාජය විසින් ක්‍රමයෙන් නොසලකා හරිනු ලැබීම ය.

පිරිවෙන හා විශ්වවිද්‍යාලය වෙනම ආයතන ලෙස පැවති අවධියෙහි අඩුම තරමින් පිරිවෙන සාම්ප්‍රදායික අධ්‍යාපනය උසස් මට්ටමකින් ලබාදෙන ආයතනයක් ලෙස සමාජගත වී තිබුණි. සාම්ප්‍රදායික අධ්‍යාපනය යන්නෙන් නොවැදගත් යල්පැනගිය, ප්‍රාදේශීය, ජාත්‍යන්තර නොවන, ඊනියා නූතන නොවන ආදී අදහස් සමුදායක් කියැවෙන බව සැබෑ ය. සාම්ප්‍රදායික යන ව්‍යවහාරය ම බටහිරයන් විසින් පටබඳිනු ලැබූවකි. එසේ වුවත් පිරිවෙනින් ලැබුණේ උසස් මට්ටමක අධ්‍යාපනයක් බව බොහෝ දෙනාගේ පිලිගැනීම විය.

එහෙත් පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත්වීමෙන් පසුව පිඑවෙන් ලෙස තවදුරටත් ඉතිරි වූ ආයතනවලින් ලබාදුන් අධ්‍යාපනය උසස් මට්ටමක වී යැයි පිළිගැනීමට කැමති වූ පිරිසක් වී නම් ඒ ඉතා අල්ප විය යුතු ය. ඒ ආයතනවල පැවිදි පඬිවරුන් කිහිප දෙනකු හෝ නුගැන්වී යැයි මෙයින් ගම්‍ය නො වෙයි. එහෙත් සමාජය විසින් ඒ ඉතිරි වූ පිරිවෙනට ලබා දෙන ලද්දේ ඉතා අඩු වැදගත්කමකි. තරුණ ශිෂ්‍ය භික්‍ෂූන් වහන්සේ වැඩි කැමැත්තක් දැක්වූයේ පිරිවෙනට ඇතුල්වීමට නොව විශ්වවිද්‍යාලයට ඇතුල්වීමට ය. කලෙක රාජකීය පණ්ඩිත යන්නට සමාජයේ වැදගත්කමක් තිබිණි. අද ඒ තැන උපාධියේ ප්‍රථම පන්ති සාමාර්ථයට හිමි වී ඇත. තරුණ භික්‍ෂූන් වහන්සේගේ අවශ්‍යතාව රාජකීය පණ්ඩිත හිමිනමක් වීම නොව හැකිනම් ප්‍රථම පන්තියේ උපාධිධරයකු වීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva